මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :PRE/2024/33 2024.08.15

**ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21**
**නාමයෝජනා පිළිබඳ තීරණ දැනුම් දීමේ නිවේදනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීම, ධුරය දරන ජනාධිපතිවරයාගේ ධුරකාලය ඉකුත්වීමට පෙර මාසයකට අඩු නොවන සහ මාස දෙකකට වැඩි නොවන කාල සීමාවක් තුළ පැවැත්විය යුතු යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වැනි අනුව්‍යවස්ථාවේ නියමිතව ඇති හෙයින්ද,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ වැනි ව්‍යවස්ථාව සමඟ කියැවෙන, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 2 වැනි වගන්තියෙන් මැතිවරණ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල අනුව, අංක 2394/51 සහ 2024 ජූලි මස 26 වන සිකුරාදා දින ප්‍රසිද්ධියට පත්කරන ලද රජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් 2024 අගෝස්තු මස 15 වන දින ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා අපේක්ෂකයන් නාමයෝජනා කිරීමේ දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

2024 අගෝස්තු මස 14 වන දින මධ්‍යාහ්න 12.00 දක්වා ඇප මුදල් භාරගන්නා ලද අතර, එම කාල පරිච්ඡේදය තුළ, පිළිගත් දේශපාලන පක්ෂ විසින් යෝජනා කරන ලද අපේක්ෂකයන් 22 දෙනකු ද, වෙනත් දේශපාලන පක්ෂ වෙනුවෙන් යෝජනා කරනු ලබන අපේක්ෂකයන් 01 අයෙකු ද, ඡන්ද හිමියන් විසින් යෝජනා කරනු ලබන අපේක්ෂකයන් 17 දෙනෙකු ද, වශයෙන් අපේක්ෂකයන් 40 දෙනෙකු වෙනුවෙන් ඇප මුදල් භාරගන්නා ලදී.

එම ඇප මුදල් තැන්පත් කළ අපේක්ෂකයන් අතරින් පිළිගත් දේශපාලන පක්ෂ 22 ක, වෙනත් දේශපාලන පක්ෂ 01 ක සහ ඡන්ද හිමියන් යෝජනා කරනු ලබන අපේක්ෂකයන් 16 දෙනෙකුගේ නාමයෝජනා පත්‍ර 39 ක් අද දින පෙරවරු 09.00 සිට පෙරවරු 11.00 දක්වා මැතිවරණ කොමිෂන් සභාව වෙත භාරදෙන ලද අතර, ඇප තැන්පත් කළ අපේක්ෂකයන් එක් අයෙකු නාමයෝජනා පත්‍ර භාර නොදෙන ලදී. ඒ අනුව අද දිනයේ දී භාරදුන් නාමයෝජනා පත්‍ර 39 ම පිළිගන්නා ලදී.

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම 2024 සැප්තැම්බර් මස 21 වන දින පෙ. ව. 7.00 සිට ප.ව. 4.00 දක්වා කාලය තුළ පැවැත් වේ.

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)